## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)

## පුරප්පාඩු

### අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජ්‍යෙෂ්ඨ උපදේශක, උපදේශක, ලේඛකාධිකාරී තනතුරු

*(ස්ථිර / ද්විතීයන සහ අභ්‍යන්තර උසස්වීමේ පදනම)*

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) යනු ඉගෙනුම් සහ සංවර්ධනය, කළමනාකරණ උපදේශන සේවා හා පර්යේෂණ හරහා ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ධාරිතාව ගොඩ නැංවීම සම්බන්ධයෙන් වගකිව යුතු ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයයි.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජ්‍යෙෂ්ඨ උපදේශක, උපදේශක, ලේඛකාධිකාරී තනතුරු පුරප්පාඩු ස්ථිර / ද්විතීයන හා අභ්‍යන්තර උසස්වීමේ පදනම මත සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්**

| | |
|---|---|
| බාහිර අයදුම්කරුවන් | <u>අවශ්‍ය සුදුසුකම් හා දීමනා</u><br>(අ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පළමු වැනි පන්තියේ හෝ දෙවැනි පෙළ ඉහළ පන්තියේ සාමාර්ථයක් සහිත විශේෂ උපාධියක් හා පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>(ආ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයට අදාළ විෂයයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් හා ආචාර්ය උපාධියක් ලබා තිබීම.<br>සහ<br>(ඇ) රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ විධායක/ කළමනාකරණ තනතුරුවල වසර විස්සක (20) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් අවුරුදු පහක (05) කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (MM/HM) මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමේ/පර්යේෂණ/උපදේශක සේවා කටයුතු පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.<br>• වයස අවුරුදු 35ට නොඅඩු අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.<br>• වැටුප් පරිමාණය - HM 2-3-2025 - Rs.173,000-12×4,850 =231,200/-<br>තෝරාගැනීමේ ක්‍රමවේදය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් |
| අභ්‍යන්තර අයදුම්කරුවන් | <u>අවශ්‍ය සුදුසුකම් හා දීමනා</u><br>(අ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පළමු වැනි පන්තියේ හෝ දෙවැනි පෙළ ඉහළ පන්තියේ සාමාර්ථයක් සහිත විශේෂ උපාධියක් හා පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>(ආ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයට අදාළ විෂයයක් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.<br>හා<br>(ආ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කළමනාකරණ, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරියෙකු වශයෙන් වසර විස්සක (20) ක පළපුරුද්ද සහ ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙකු වශයෙන් සේවය කර තිබීම.<br>• වැටුප් පරිමාණය - HM 2-3-2025 - Rs.173,000-12×4,850 =231,200/-<br>තෝරාගැනීමේ ක්‍රමවේදය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

Gazette.lk

| ද්විතියන පදනම | අවශ්‍යා සුදුසුකම් හා දීමනා |
| --- | --- |
| | (අ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• දැනට ලබමින් සිටින මූලික වැටුප + එම වැටුපෙන් 28% ක ද්විතීයන දීමනාව + රු.800.00<br>තෝරාගැනීමේ ක්‍රමවේදය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

**02. ජ්‍යෙෂ්ඨ උපදේශක**

| ද්විතියන පදනම | අවශ්‍යා සුදුසුකම් හා දීමනා |
| --- | --- |
| | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළ ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත දීප ව්‍යාප්ත සේවයක I පන්තියේ / විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>හෝ<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළ ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ විධායක මට්ටමේ I පන්තියේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම.<br>• රාජ්‍ය සේවකයින් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.<br>• දැනට ලබමින් සිටින මූලික වැටුප + එම වැටුපෙන් 28% ක ද්විතීයන දීමනාව + රු.800.00<br>තෝරාගැනීමේ ක්‍රමවේදය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්<br>**මූල්‍ය කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රවීණතාව සහිත අයදුම්කරුන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ** |

**03. උපදේශක**

| ද්විතියන පදනම | අවශ්‍යා සුදුසුකම් හා දීමනා |
| --- | --- |
| | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත දීප ව්‍යාප්ත සේවයක II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>හෝ<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළ ව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ විධායක මට්ටමේ I පන්තියේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම.<br>• රාජ්‍ය සේවකයින් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.<br>• දැනට ලබමින් සිටින මූලික වැටුප + එම වැටුපෙන් 28% ක ද්විතීයන දීමනාව + රු.800.00<br>තෝරාගැනීමේ ක්‍රමවේදය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්<br>**පර්යේෂණ ක්‍රමවේදයන්, භාෂා, තොරතුරු තාක්ෂණය, නීතිය, මූල්‍ය කළමනාකරණය යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රවීණතාව සහිත අයදුම්කරුන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ** |

**04.** ලේඛකාධිකාරී

| ද්විතියන පදනම | <u>අවශ්‍ය සුදුසුකම් හා දීමනා</u><br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• රාජ්‍ය සේවකයින් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.<br>• දැනට ලබමින් සිටින මූලික වැටුප + එම වැටුපෙන් 25% ක දීමනාව<br>තෝරාගැනීමේ ක්‍රමවේදය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් |
|---|---|

**පොදු කරුණු :**

- සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අදාළ සහතිකවල ඡායා පිටපත් සමඟ **"අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07"** යන ලිපිනයට 2026.10.09 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
- ද්විතීයන පදනම මත යොමු කරන අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය
- ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- අදාළ විස්තර සහ සහතිකවල ඡායා පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම් පත්‍රය SLIDA වෙබ් අඩවිය මගින්( www.slida.lk) හා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය මඟින් (www.pubad.gov.lk) බාගත කර ගත හැකිය
- ඉහත සියලු බඳවා ගැනීම් සම්බන්ධ අවසාන තීරණය පාලක මණ්ඩලය සතු වේ.


අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
28/10, මළලසේකර මාවත
**කොළඹ 07.**
දුරකථන: 94 11 5980200 ෆැක්ස් : 94 11 2584406
ඊමේල් : mail@slida.lk